සියලු ම හිමිකම් ඇවිරිණි /All Rights Reserved ]

Ravindu Bandaranayake - ictfromabc

**Information and Communication Technology**
**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

# 2026 QUIZ NO 419

2026/02/02
ictfromabc
Ravindu Bandaranayake

1. Which of the following best describes the importance of computer networks and the World Wide Web (WWW)?
පරිගණක ජාල සහ ලෝක විසිරි වියමන (WWW) වල වැදගත්කම පහත සඳහන් දේවලින් වඩාත් හොඳින් විස්තර කරන්නේ කුමක්ද?

    1) They have replaced all traditional forms of communication.
    එමගින් සියලු සම්ප්‍රදායික සන්නිවේදනයන් ප්‍රතිස්ථාපනය කර ඇත.
    2) They restrict access to important data for security.
    එමගින් ආරක්ෂාව සඳහා වැදගත් දත්ත වෙත ප්‍රවේශය සීමා කරයි.
    3) They facilitate efficient information sharing and retrieval.
    එමගින් කාර්යක්ෂම තොරතුරු හුවමාරු කර ගැනීමට සහ ලබා ගැනීමට පහසුකම් සපයයි.
    4) They have made information management slower but more accurate.
    එමගින් තොරතුරු කළමනාකරණය මන්දගාමී නමුත් වඩාත් නිවැරදි කර ඇත.
    5) They reduce the need for cloud computing technologies.
    එමගින් වළාකුළු පරිගණන තාක්ෂණයන් සඳහා අවශ්‍යතාවය අඩු කරයි.

2. A communication system transmits 8-bit binary sequences, with each sequence representing a number in two's complement format. If the transmitted sequence is 11110100, what is the equivalent decimal value?
සන්නිවේදන පද්ධතියක් බිටු 8හි ද්විමය අනුක්‍රම සම්ප්‍රේෂණය කරයි, සෑම අනුක්‍රමයක්ම දෙකෙහි අනුපූරක ආකෘතියෙන් සංඛ්‍යාවක් නියෝජනය කරයි. සම්ප්‍රේෂණය කරන ලද අනුපිළිවෙල 11110100 නම්, එයට සමාන දශමය අගය කුමක්ද?

    1) -9    2) -11    3) -12    4) 11    5) 12

3. What is a primary characteristic of sequential circuits compared to combinational circuits?
සංයෝජන පරිපථවලට සාපේක්ෂව අනුක්‍රමික පරිපථවල (sequential circuits) මූලික ලක්ෂණය කුමක්ද?

    1) They do not use any memory elements. / ඒවායේ කිසිදු මතක අංගයක් භාවිතා නොකරයි.
    2) Their output depends only on current inputs. / ඒවායේ ප්‍රතිදානය වත්මන් ආදාන මත පමණක් රඳා පවතී.
    3) Their output depends on the current inputs and past history. / ඒවායේ ප්‍රතිදානය වත්මන් ආදාන සහ අතීත ඉතිහාසය මත රඳා පවතී.
    4) They are faster than combinational circuits. / ඒවා සංයුක්ත පරිපථවලට වඩා වේගවත් වේ.
    5) They require fewer components. / ඒවාට අඩු සංරචක අවශ්‍ය වේ.

4. The type of operating system used for second generation computers is,
දෙවන පරම්පරාවේ පරිගණක සඳහා භාවිතා කළ මෙහෙයුම් පද්ධති වර්ගය වන්නේ,

    1) Multi user බහු පරිශීලක
    2) Multi treading බහු පොට
    3) Single user ඒක පරිශීලක
    4) Multi tasking බහු කාර්යය
    5) Multi programming බහු වැඩසටහන්

5. What is a computerized database**?**
පරිගණකගත දත්ත සමුදායක් යනු කුමක්ද?
   1) A software program used to type documents
   ලේඛන ටයිප් කිරීමට භාවිතා කරන මෘදුකාංග ඇඩසටහනක්
   2) An organized collection of related data stored and accessed electronically
   ඉලෙක්ට්‍රොනිකව ගබඩා කර ඇති දත්තවල සංවිධානාත්මක එකතුවක්
   3) A programming language
   ක්‍රමලේඛන භාෂාවක්
   4) A computer hardware component
   පරිගණක දෘඩාංග සංරචකයක්
   5) A collection of random files without structure
   ව්‍යුහයක් නොමැති අහඹු ගොනු එකතුවක්

6.
```
def square_list(lst):
      return [x ** 2 for x in lst]
```
What is the output of the above Python code when the function `square_list` is called with the argument `[1, 2, 3, 4]`?
`[1, 2, 3, 4]` යන argument එක සහිතව `square_list` ශ්‍රිතය ඇමතූ විට ඉහත පයිතන් කේතයේ ප්‍රතිදානය කුමක්ද?

   1) `[1, 4, 9, 16]`
   2) `[1, 2, 3, 4]`
   3) `[1, 8, 27, 64]`
   4) `[1, 4, 6, 8]`
   5) `[1, 2, 3, 4, 5]`

7. Consider the following Python code.
පහත පයිතන් කේතය සලකා බලන්න.
```
numbers = [1, 2, 3, 4, 5]
index = 0
result = []

while index < len(numbers):
    if numbers[index] % 2 == 0:
        result.append(numbers[index] ** 2)
    else:
        result.append(numbers[index] ** 3)
    index += 1

print(result)
```
What will be the output of the above code?
ඉහත කේතයේ ප්‍රතිදානය කුමක් වේවිද?

   1) `[1, 4, 9, 16, 25]`
   2) `[1, 4, 27, 16, 125]`
   3) `[1, 4, 9, 16, 125]`
   4) `[1, 4, 27, 16, 25]`
   5) `[1, 8, 27, 64, 125]`

8. What will be the output of the following code?
පහත කේතයේ ප්‍රතිදානය කුමක් වේද ?
```
result = (-7 + 3) * (-2 - 1) // -2
print(result)
```
1) `-6`  2) `6`  3) `0`  4) `3`  5) `-9`

9. What is the main tag used to render a text box by a web browser?
වෙබ් අතරික්සුවකින් text box එකක් විදැහුම්කරණයට භාවිතා කරන ප්‍රධාන උසුලනය(tag) කුමක්ද?

1) `<input>` 2) `<text>` 3) `<type>` 4) `<form>` 5) `<text box>`

10. A `<video>` tag with autoplay works on desktop but not on mobile. What's the hidden culprit?
ස්වයංක්‍රිය වාදනය සහිත `<video>` උසුලනයක් desktop එකේ ක්‍රියා කරන නමුත් ජංගම දුරකථනයේ ක්‍රියාත්මක නොවේ. සැඟවුණු වැරැද්ද කුමක්ද?

1) Missing muted attribute / muted ගුණාංගය මග හැරී ඇත.
2) Browser doesn't support MP4 / වෙබ් අතරික්සුව MP4 සඳහා සහය නොදක්වයි.
3) Video file is corrupted / වීඩියෝ ගොනුව විකෘති වී ඇත.
4) Add playsinline attribute / playsinline ගුණාංගය එක් කළ යුතුය.
5) Use poster attribute / Poster ගුණාංගය භාවිතා කළ යුතුය.